සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

# "අදිති"

පැය 1 විනාඩි 15

## පෙරහුරු විභාගය - 10

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. පහත ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න සඳහා ඡේදය ඇසුරින් ම පිළිතුරු සපයන්න.**

ඇරිස්ටෝටල් බියගුල්ලෙක් නොවීය. චන්ද්‍ර ග්‍රහණය කීප වරක් ම නිරීක්ෂණය කළ ඔහුට කිසිදු රෝගයක් හෝ නොවැලඳිණි. මේ විද්‍යාඥයාගේ නිරීක්ෂණයෙන් පසු ඔහු කළ නිගමනය මෙසේ ය. චන්ද්‍රයාට සහ සූර්යයාට මැදින් පෘථිවිය සිටින විට, පෘථිවියේ සෙවණැල්ල චන්ද්‍රයා මත වැටීමෙන් මේ චන්ද්‍ර ග්‍රහණය ඇතිවේ. මේ හෙවණැල්ල හැමදාම වටකුරු මන්ද? ඇරිස්ටෝටල්, රොටියක් සේ වටකුරු පූපයක් ගෙන එය හිරු එළියට ඇල්ලීය. එක් තැනකදී එය වටකුරු වුවද පූපය හරවන විට අනික් තැනදී එය රිටක් සේ සිහින් විය. එසේ නම් පෘථිවිය වටකුරු පූපයක් වැනි සිහින් දෙයක් විය නොහැකි ය.

(i) ඡේදයෙන් කියවෙන්නේ කෙබඳු අයෙක් පිළිබඳව ද? ..............................................................

(ii) පෘථිවියේ සෙවණැල්ල චන්ද්‍රයා මත වැටීමෙන් ඇති වන්නේ කුමක් ද? ..............................

(iii) හෙවණැල්ල සැමදා වටකුරු ලෙස පවතින්නේ කුමක ද? .....................................................

(iv) පෘථිවිය විය නොහැක්කේ යැයි සඳහන් වන්නේ කුමන දෙයක් ලෙසින් ද? ......................

..............................................................................................................................

(v) ඡේදයේ සඳහන් උපමාවක් ලියන්න. ..........................................................................

(vi) පාපිලි දෙකක් පමණක් යෙදුණ වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. ...............................

(ලකුණු 06)

02. වචන පේළි අතරින් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i)
(අ) විශිෂ්ඨ, වෙළ, සළකුණ
(ආ) පරිසණක, මර්ධනය, ප්‍රහේළිකාව
(ඇ) පළඟැටියා, කනගාටුව, පිළියෙල

(ii)
(අ) ප්‍රස්ථාව පිරුළු, වැසිකිළිය, සෙවන
(ආ) කම්මැළි, නෙලුම්මල, ඇසළ
(ඇ) කැළණි, දැකුම්කළු, බරපතල

(ලකුණු 02)

03. මෙම වාක්‍ය අතීත කාලයට හරවා ලිඛිත බසින් ලියන්න.

(i) රට වැසියෝ රබන් වයා විනෝද වෙනවා

..............................................................................................................................

(ii) මකුළුවා වේගයෙන් කපු පුළුන් කනවා

..............................................................................................................................

(ලකුණු 02)

04. වගුවෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| වචනය | ශබ්දය | පිල්ලම් නාමය |
|---|---|---|
| නෞකාව | | |
| සොරොච්චි | | |

(ලකුණු 02)

05. පහත සඳහන් ප්‍රකාශ සඳහා ගැළපෙන ප්‍රස්තාව පිරුළු වරහනෙන් තෝරා ලියන්න.

(i) අදුරදර්ශී උපදෙස් දීම - ..............................................................................

(ii) විමසීමකින් තොරව යමක් කිරීම - ..............................................................

(කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩුතීන්දුව වගේ / මහදැන මුත්තාගේ නුවණ වගේ / කළුවා මාරපන් ගියා වගේ) (ලකුණු 02)

06. පහත වැකි සඳහා ගැළපෙන විරාම ලකුණු යොදන්න.

(i) අහෝ කොතරම් නුනුවණ කමෙක් ද (ii) හැබෑට ඒ මොකක්ද ගමරාළ (ලකුණු 02)

07 මෙම වාක්‍ය අතීතකාල ස්ත්‍රී ලිංග වාක්‍ය ලෙස ලියන්න.

(i) ඔහු වේගයෙන් දිව යයි.

.......................................................................................................................................

(ii) සිංහයා වනයේ සැරිසරයි.

.......................................................................................................................................

(ලකුණු 02)

08. පහත කවි පදය ඇසුරින් පිළිතුරු ලියන්න.

ආදර වදනින් අප සනසයි - ආච්චි ගෙදරට සිරියාවයි.

ඉහත කවියේ සඳහන්

(i) ස්ථාන නාමය .......................................... (ii) පුද්ගල නාමය ..................................... (ලකුණු 02)

09. පහත වගන්ති වල හිස්තැනට ගැළපෙන නාම පදය දී ඇති පද අතරින් තෝරන්න.

(i) ඔහු ප්‍රධාන .......................................... ගේ චරිතය රඟපෑවේය (නිළිය / නළුවා)

(ii) මගේ .................................... වන සුරංගි කවි සෑදීමට දක්ෂය (නංගී / මල්ලී) (ලකුණු 02)

10. දෙමළ වචන වල සිංහල තේරුම සිංහල අකුරින් ලියන්න.

(i) නල්ල සුහම් - .......................................................................................................

(ii) පදිනොරු මණි - .......................................................................................................

(ලකුණු 02)

11. පහත දෙමළ වගන්තිවල සිංහල අර්ථය සිංහල අකුරින් ලියන්න.

(i) උංගල් පෙන්සිල් එදු ? - ..............................................................................................

(ii) තණ්ණීර් කොඩුක්ජම් තාරුංගල් - ..............................................................................

(ලකුණු 02)

12. වචන ගළපා අර්ථවත් ඉංග්‍රීසි වැකිය ඉංග්‍රීසි අකුරින් ලියන්න.

(i) Piece / want / I / to / cloth / a / cut / of


.......................................................................................................................................

(ii) many/ are / How / there ? / flowers

.......................................................................................................................................


(ලකුණු 02)

13. (i)



| | | | | |
|---|---|---|---|---|
| | | o | | n |

(ii)



| | | | | | |
|---|---|---|---|---|---|
| | | m | | | r |

(ලකුණු 02)


14. දී ඇති සංඛ්‍යාවට 100 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

5 4 9 7 6 - ............................................................................................... (ලකුණු 02)

15. පහත සංඛ්‍යා රටාවේ **පස්වන හා හත්වන** ස්ථානයට යෙදෙන සංඛ්‍යා දෙක ලියන්න.

(ලකුණු 02)

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| 5337 , | 5342 , | 5347 , | .................. , | .................. , | .................. , | .................. |


16. 

මෙම චතුරස්‍රයේ පාටකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.
.......................................... (ලකුණු 02)

17. පහත සඳහන් බිල්පත සම්පූර්ණ කරන්න.


| ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල | | ගෙවිය යුතු මුදල | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | ශත | රුපියල් | ශත |
| අඹ | (i)......................... | 20 | 00 | (ii)......................... | ......... |
| පේර | 07 | (iii)......................... | ......... | 168 | 00 |
| මිදි | 300 g | 530 | 00 | (iv)......................... | ......... |
| ගෙවිය යුතු මුළු මුදල | | | | 427 | 00 |

(ලකුණු 04)

18. 


A භාජනයේ ඇති බීම ප්‍රමාණයෙන් B භාජනය පුරවා ඉතිරි කොටස වීදුරු 5 කට සමානව දැමුවේ නම් එක වීදුරුවක බීම ප්‍රමාණය කොපමණ ද? ............................................ (ලකුණු 02)

19. අරුණ නිවසට පැමිණෙන විට රූපවාහිනී තිරයේ වේලාව 18:35 ලෙස සටහන්ව තිබුණි. මගේ ගමනට පැ' 9 මි. 45 ක් ගත වී ඇති බව අරුණ මව සමඟ පැවසීය. අරුණ ගමන පිටත් වූ වේලාව සාමාන්‍ය වේලාවෙන් ලියන්න. ...................................................................... (ලකුණු 02)

20. 



A ඝන වස්තුවේ ඇති දාර ගණන හා B ඝන වස්තුවේ ඇති ශීර්ෂ ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න.

A ........... B ............ (ලකුණු 02)

21. තොරණක රතුපාට බල්බ මෙන් අඩක් කහපාට බල්බද, එම දෙවර්ගයටම සමානව නිල්පාට බල්බද ඇත. එහි කහපාට බල්බ ගණන 448 ක් නම් වර්ණ තුනෙන්ම ඇති බල්බ ගණන කීයද?
..................................................................................................................................... (ලකුණු 02)

22. (i) පැය 2යි මි.30ක ඇති මිනිත්තු ගණන ................. (ii)5 kg 55g ක ඇති ග්‍රෑම් ගණන ..................
(ලකුණු 02)

23. පංතියක සිටින ශිෂ්‍ය ගණනින් $\frac{3}{5}$ ක් පිරිමි ළමයි වේ. පංතියේ සිටින මුළු ශිෂ්‍ය ගණන 40 ක් නම් පංතියේ සිටින ගැහැනු ළමයි ගණන කීයද? ............................................ (ලකුණු 02)


24. 


A සිට D දක්වා දුර 50 km කි. AB දුර සහ CD දුර සමාන වේ නම් B සිට D දක්වා දුර කොපමණ ද? ........................................................................................................ (ලකුණු 02)

25. එක් ළමයෙකුට පොත් 4 බැගින් පොත් 828ක් ළමයි කී දෙනෙකුට බෙදා දිය හැකි ද?
........................................................................................................................ (ලකුණු 02)


26. එකක් රු.17.00 බැගින් වන පැන්සල් 5ක් මිලට ගෙන රු.100.00 නෝට්ටුවක් දුන් පසු වෙළෙන්දා නැවත රු.5.00 ක් ඉල්ලා ගෙන එක් නෝට්ටුවක් ඉතිරි ලෙස ලබා දුන්නේ ය. එම නෝට්ටුව කුමක්ද ? ........................................................................................ (ලකුණු 02)

27. වර්තමානයේ අප භාවිත කරන සියලුම මුදල් නෝට්ටුවල වටිනාකම කීයද?
රු. ........................................................................................................ (ලකුණු 02)

28. 

මෙම ඝන වස්තුවේ ඉදිරි පෙනුමේ ඇති තිත් ගණනේ දෙගුණය පැති පෙනුමේ ඇත' . පැති පෙනුමේ දෙගුණය සැලැස්මේ ඇත. ඒ අනුව,
සැලැස්ම - පැති පෙනුම × ඉදිරි පෙනුම =.....................(ලකුණු 02)

29. සිසුන් 38 දෙනෙකු සිටින පංතියකට පොත් ලබාදීමේ දී ඇතැම් පොත් සිසුන් ගණනට වඩා අඩුවෙන් ලැබී තිබුණි. එම අඩු පොත් ප්‍රමාණය ප්‍රස්තාරයේ දැක්වේ.




(i) දෙමළ පොත් 32 ක් ලැබී තිබුණි නම් අඩු පොත් ප්‍රමාණය ප්‍රස්තාරයේ දක්වන්න.


(ii) ලැබුණු මුළු පොත් ගණන කීයද?
................................................................ (ලකුණු 02)

30. ශ්‍රී ලංකාව සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රී ලංකාව බහු ආගමික රටකි. (2) ශ්‍රී ලංකාව එක් සංස්කෘතියක් පවතින රටකි.
(3) ශ්‍රී ලංකාව දූපතකි

31. පාද හයක්, පාද අටක් හා පාද දහයක් ඇති සතුන් තිදෙනෙක් පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) සමනලයා, බත්කූරා, ඉස්සා (2) කූඹියා, මකුළුවා, කකුළුවා
(3) ගෝනුස්සා, ඉස්සා, කකුළුවා

32. ශ්‍රී ලංකාවේ ගල් අඟුරු බලාගාරයක් පිහිටි ප්‍රදේශයකි.
(1) මහියංගනය (2) යාපනය (3) නොරොච්චෝල

33. අතීතයේ දී මෙම ක්‍රමය මගින් ගමන් කළ හැකි වූයේ,





(1) රජවරුන්ට හා බිසෝවරුන්ට
(2) සාමාන්‍ය ජනතාවට
(3) ගිලන් වූ පුද්ගලයාට


34. ඉංග්‍රීසි කොඩිය බිම දමා අපේ ජාතික කොඩිය එසවීමට එඩිතර වූ රට, ජාතිය ආගම වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළ හිමි නමකි.

(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(3) වාරියපොල ශ්‍රී සුමංගල හිමි

35. රත් වූ යකඩ ඇල්ලීමටත්, වගා කරන භූමිය මට්ටම් කිරීමටත් යොදා ගන්නා උපකරණ පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.


(1)


(2)


(3)

36. පාසල් දරුවකු ලෙස ඔබට කළ හැකි ධනාත්මක වෙනස්කමකි.

(1) කසළ තැන් තැන්වල දැමීම (2) පොත් මේසය පිළිවෙළට තබා ගැනීම.
(3) ඇඳුම් අල්මාරිය අපිළිවෙළට තැබීම.

37. ශ්‍රී ලංකාවේ රූකඩ සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් සහ පැදුරු සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) අම්බලන්ගොඩ හා දුම්බර (2) උඩුපිල හා කැලණිය
(3) මහනුවර හා යාපනය


38. සුඛෝපභෝගී වෙළඳසැළක ගනුදෙනු කිරීමේ දී වර්තමානයේ භාවිත වන දෙයකි.


(1) ක්‍රෙඩිට් කාඩ් (2) කාසි (3) නෝට්ටු

39. ශරීරයට අහිතකර ආහාර වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) බීම වර්ග, ටොෆි වර්ග, ක්ෂණික කෑම වර්ග
(2) පලතුරු, දේශීය පාන වර්ග, පලා වර්ග
(3) චොක්ලට්, පැණි රස කෑම, එළවළු

40. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.


(1)



(2)



(3)


41. එරබදු, වෙසක් හා බිනර මල් පිපෙන මාස පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) අප්‍රේල්, ජූනි, ඔක්තෝබර් (2) මැයි, ජූලි, අගෝස්තු
(3) අප්‍රේල් මැයි හා සැප්තැම්බර්

42. පස පෙරළීමට වළක් හාරා ගැනීමට යොදා ගන්නා උපකරණ දෙක පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.


(1)


(2)


(3)

43. ඔබ නොදන්නා ප්‍රදේශයක ගමන් කිරීමේ දී යම් ස්ථානයකට යාමට නියමිත මාර්ගය සොයා ගැනීමට අපහසු නම් ඔබට එය සොයා ගැනීමට කළ හැකි ක්‍රමයකි.

(1) ජංගම දුරකථනවල මෘදුකාංගය භාවිතයෙන් මාර්ගය සොයා ගැනීම.
(2) නැවත ආපසු නිවසට පැමිණ එම ප්‍රදේශය පිළිබඳ ව දන්නා පුද්ගලයෙකු සමඟ නැවත දිනක යාම.
(3) ඔබට අවශ්‍ය ස්ථානය හමුවන තුරු ඇති පුවරු දෙස බලමින් ඉදිරියට යාම.


44. දේදුන්නක් සැම විටම පායන්නේ,
(1) උතුරු දිශාවෙනි.
(2) නැගෙනහිර දිශාවෙනි.
(3) හිරු පායා ඇති දිශාවට විරුද්ධ දිශාවෙනි


45. ''ගමන බිමන හරි කඩිසර ඔසවාගෙන යයි බැරිබර'' ගීතය ගායනා කරනු ලබන්නේ,
(1) ප්‍රඩී සිල්වා මහතා (2) එම්.එස්.ප්‍රනාන්දු මහතා (3) සුනිල් ශාන්ත මහතා


46. 'අලස නොවී වැඩ කිරීම' නමැති යහපත් ගුණාංගය දැකිය හැකි සතුන් දෙදෙනෙකි.
(1) මී මැස්සා හා කුඹියා (2) වේයා හා බල්ලා (3) ගවයා හා පැණිකුරුල්ලා

47. අතු කැබලි සිටුවා පැළ ලබා ගත හැකි බෝග වර්ග දෙකකි.
(1) කංකුං, නිවිති (2) මුකුණුවැන්න හා මිරිස් (3) බතල හා වම්බටු

48. මුළුතැන්ගෙයි ඇති උපකරණ දෙකකි.



(1)



(2)



(3)

49. පෞද්ගලිකව පරිහරණය කරනු ලබන භාණ්ඩ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දත් බුරුසුව, පනාව, පිඟාන හා කෝප්පය
(2) උපැස් යුවල, කොට්ටය, දුරකථනය හා රූපවාහිනිය
(3) මේසය, පුටුව, ඔරලෝසුව හා පාවහන්

50. රූප සටහනේ දැක්වෙන්නේ අතීතයේ වගාවන් ආරක්‍ෂා කර ගැනීමට යොදාගත් උපක්‍රම කීපයකි. ඒවා හඳුනාගෙන පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.









(1) සෙක්කුව, පඹයා, සුළං ටකය (2) දිය හොල්මන, පඹයා , බඹරය
(3) දිය හොල්මන, පඹයා, සුළං ටකය

51. රූපයේ දැක්වෙන ස්ථානය පිහිටි පළාත වන්නේ,




(1) උතුරු මැද (2) නැගෙනහිර
(3) මධ්‍යම

52. රූපයේ දැක්වෙන්නේ,



(1) වරා (2) හොර
(3) කොට්ට පුලුන්

53. බීජ ඉවත් කර ආහාරයට ගන්නා එළවළු වර්ගයක් හා පලතුරු වර්ගයක් පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) වම්බටු, වරකා (2) වට්ටක්කා, ඩ්‍රැගන්ෆෲට් (3) කැකිරි, කොමඩු

54. සතුන් විනාශ වීමට හේතු වන මිනිස් ක්‍රියාකාරකමක් නොවේ.


(1) පහත් බිම් ගොඩ කිරීම (2) වනාන්තර ගිනි තැබීම (3) සතුන් දඩයම් කිරීම


55. රූපයේ දැක්වෙන්නේ,




(1) පලාපෙති මෝස්තරයකි.
(3) ලියවැල් මෝස්තරයකි.
(2) ගල් බිංදුව මෝස්තරයකි.

56. ගෙබිම තිරස් බව මැන ගැනීම සඳහා යොදා ගන්නා උපකරණයක් සහ ලීයක සිදුරක් විද ගැනීමට යොදා ගන්නා උපකරණයක් පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.


(1)



(2)



(3)


57. පියාපත් ඇති වරල් නැති සතෙක් සහ වරල් ඇති පාද නැති සතෙක් පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) ගිරවා, මාළුවා (2) බල්ලා, මකුළුවා (3) ගැඩවිලා, ගිරවා

58. පුවක් ගෙඩියක් කපා ගැනීම සහ කඩදාසි කැපීම සඳහා යොදා ගන්නා උපකරණ පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.


(1)


(2)


(3)

59. ජාතික කොඩියේ ඇති ප්‍රධාන වර්ණ ගණන සහ බෝ කොළවල වර්ණය පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

(1) 5, කොළ (2) 4, කොළ (3) 4, කහ

60. වැසි සමය අවසන් වීමත් සමඟ ඩෙංගු උවදුර නැවතත් හිස ඔසවමින් පවතින බව සෞඛ්‍ය අංශ විසින් පාසලේ සියලු දෙනා දැනුවත් කරන ලදී. ඊට පිළියමක් වශයෙන් පාසලේ වටපිටාව පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පැවැත්විය යුතු බවට තීරණය විය. ඒ සඳහා පැවති ශ්‍රමදානයට ඔබද සහභාගී වූයේ යැයි සිතා එහි දී ඔබ කළ කී දේ ඇතුළත්, වචන පහකට නොඅඩු උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වාක්‍ය 03 ක් ලියන්න.

(1) ..............................................................................................................

..............................................................................................................

(2) ..............................................................................................................

..............................................................................................................

(3) ..............................................................................................................

..............................................................................................................